## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 1 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 43 වන ඡේදය අනුව ක්ෂය වන වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය වෙනස්වීම ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගැලපීම් කළයුතු වුවද ආයතනය සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ ක්ෂය අනුපාතය සියයට 10 සිට සියයට 20 දක්වා වැඩි කිරීම ගිණුම්කරණ | ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ලෙස සලකා ප්‍රමිති ප්‍රකාරව 2023 වර්ෂයේදී ගැලපීමට පියවර ගනු ලබන අතර සංසන්දනාත්මක අගයන් ද හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපත්ති වෙනස්වීමක් ලෙස අතීතානුයෝගීව ගැලපුම්කර තිබුණි. ඒ අනුව වර්ෂයට අදාල රු.515,500 ක් වූ මෝටර් රථ ක්ෂය සහ 2022 දෙසැම්බර් 31 දිනට රු. 2,062,001 ක් වූ මෝටර් රථ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂිත වෙනස්වීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, තවදුරටත් භාවිතාකරන සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති පිරිවැය රු.48,862,850 ක් වූ පරිගණක, විද්‍යාගාර උපකරණ හා පුස්තකාල පොත් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට විදේශ ව්‍යවහාර බැංකු ගිණුමේ ඇමරිකානු ඩොලර් 25,726 ක් වූ ශේෂය එදිනට පැවති විදේශ විනිමය අනුපාතය අනුව ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් රු.897,615 ක් වූ විදේශ විනිමය හුවමාරු ලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී විදේශ හුවමාරු ලාභය නිසි පරිදි ගැලපීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය පුකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාඨමාලා ආදායමෙන් අරමුදල් 4 කට සිදුකර තිබූ රු.10,290,805 ක් වූ මාරු කිරීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ වර්ෂය අවසානයේදී ලාභයෙන් සිදුකරන විසර්ජනයන් ලෙස දැක්වීම වෙනුවට සෘජුවම ආදායමෙන් අඩු කර දක්වා තිබීම | 2023 වර්ෂයේ සිට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හරහා සිදු කිරීමට පියවර ගනු ලද බව. | මූල්‍ය පුකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයෙන් තොරව 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී තිබුණු එකතුව රු.8,923,951 ක් වූ විදේශ ප්‍රදාන ආයතනය වෙත ඍජුව ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පර්යේෂණ ප්‍රදාන 30/94 දරන රාජ්‍ය ගිණුම්කරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට මින් ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4.2 වගන්තිය | ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පූර්ණකාලීන උපාධි පාඨමාලා 4 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | උපාධි පාඨමාලා 4 සඳහා අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.892,445 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 16,588,670 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,481,115 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සහතිකපත්‍ර පාඨමාලා ආදායම රු.3,482,783 කින් වැඩිවීම හා ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.8,428,222 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ සමස්ථ ආදායමෙන් සියයට 74 කට වැඩි ප්‍රමාණයක් රජයේ ප්‍රදානවලින් සමන්විත වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 1.9 කින් වැඩි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන මත පොලී ආදායම සියයට 202 කින් ද නඩත්තු වියදම් සියයට 167 කින් ද ඉහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

**(අ) ජංගම අනුපාතය**

පසුගිය වර්ෂයේ 2.72:1 ක් වූ ජංගම අනුපාතය ප්‍රවර්තන වර්ෂයේ 4.14:1 ක් වී පැවතුණි.

**(ආ) ක්ෂණික වත්කම් අනුපාතය**

පසුගිය වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතය 2.66:1 ක් ව පැවති අතර ප්‍රවර්තන වර්ෂයේ එම අනුපාතය 4.06:1 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම) තනතුරු 2 ක් පමණක් අනුමත වී තිබියදී එම තනතුර සඳහා 07 දෙනෙකු බඳවා ගෙන තිබීම නිසා කාර්ය මණ්ඩලය 05 දෙනෙකු අතිරික්තව පැවතුණි. පැවරුම් පදනම මත බඳවා ගෙන ඇති එම අතිරික්ත නිලධාරීන් 05 සඳහා 2022 වර්ෂය තුළදී රු.2,251,884 ක් උපයා ගත් ආදායමෙන් ගෙවීම් සිදු කර තිබුණි. | අධ්‍යයන අංශවල පවතින ධාරිතාව මත මෙම තනතුරුවලට අමතරව පැවරුම් පදනම මත තාවකාලික විද්‍යාත්මක සහකරුවන් (Scientific Assistant – on assignment basis) 05ක් බඳවා ගෙන ඔවුන්ට උපයාගත් ආදායමෙන් ගෙවීම් කටයුතු සිදු කරනු ලබන බව. | විධිමත් අනුමැතිය මත පමණක් කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |